වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2024

ලෝහෝර් ආර්යා ණය අරමුදල - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

லோஹோர் சீமாட்டி கடன் நிதியம் - நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Lady Lochore Loan Fund - Ministry of Finance, Planning and Economic Development

පටුන

සංස්ථාපිත තොරතුරු 1

පාලන භාරකාරතුමියගේ පණිවුඩය 2

01. අරමුදලේ පසුබිම 3

1.1 භාරකාර මණ්ඩලය 3

02. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය 4

2.1 සංවිධාන ව්‍යුහය 5

03. ණය අරමුදල් සැපයීමේ කාර්ය සාධනය 7

3.1 2024 වසරේ ප්‍රතිලාභීන් 7

3.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය 7

3.3 ණය අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට බලපාන හේතු 8

3.4 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම 9-10

3.5 ණය අයකර ගැනීමේ ප්‍රගතිය 10

3.6 ආදායම් උත්පාදනය 11

3.6.1 ණය පොලී ආදායම 11

3.6.2 කාර්යාල සංකීර්ණයේ කුලී ආදායම 11

3.6.3 ආයෝජන ආදායම 12

3.6.4 මෙහෙයුම් ආදායම 12

3.6.5 අරමුදලෙහි තිරසාරභාවය 12

04. අනාගත සැළසුම් 13

05. අරමුණු සපුරාලීමට පවතින අභියෝග 14

06. ස්වාධීන විගණකගේ වාර්තාව 15

07. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 16

08. මූල්‍ය තත්ව ප්‍රකාශනය 17

09. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 19

10. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති 20

10.1 සාමාන්‍ය තොරතුරු 20

10.2 වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම 21

11. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024 23-29

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

සියළුම රාජ්‍ය සේවකයින්ගේ ප්‍රමුඛ හා විශ්වසනීය මූල්‍ය සහකරු වීම.

මෙහෙවර

චක්‍රීය ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා කෙටි කාලීන ක්ෂණික ණය පහසුකම් සැපයීම.

කාර්යයන්

- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ණය ලබා දීමේදී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කෙරෙන ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ජේ.කේ.එන්.සමන්මලී මහත්මිය	-	සභාපති, (අධ්‍යක්ෂක - ආයෝජන හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)
➢ කමලා රණතුංග මෙනවිය	-	පාලන භාරකාර හා භාරකාර ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	භාරකාර
➢ එම්.සී.සුබසිංහ මහත්මිය	-	භාරකාර
➢ නීතිඥ සරිත් පතිරත්න මහීපුත්‍ර මහතා	-	භාරකාර
➢ ජී.ඒ.ඩී.පී. විජේරත්න මහත්මිය	-	භාරකාර
➢ අනුරාධා ගල්ලන්ගොඩ මහත්මිය	-	භාරකාර

පාලන භාරකාරතුමියගේ පණිවුඩය



ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවා වසර 98 ක් සපිරෙන 2024 වර්ෂයේ දී ද එය ස්ථාපිත කිරීමේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ආයතනය උපරිම ආකාරයෙන් කටයුතු කර ඇති බව සමාලෝචිත වර්ෂයේ සාධනීය ප්‍රගතිය තුලින්ම සනාථ වන බව ප්‍රථමයෙන් සනිටුහන් කිරීමට කැමැත්තෙමි. ණය මෙහෙයුම් කටයුතු දියත් කිරීම 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වසරේ දී 3% කින් වර්ධනය වී ඇත.

හුදෙක් ආයතනයෙහි කාර්ය සාධනය මතම රඳා නොපවතින ණය කළඹ ප්‍රසාරණය වෙළඳපළ සාධක මත මෙන්ම පුද්ගල වරණයන් මතද තීරණය වන බැවින් එය බොහෝ අවස්ථාවල ස්වයං පාලනයෙන් නිදහස් වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ණය සැපයුම එහි ඉලක්කයන් අභිබවා යමින් රාජ්‍ය සේවා ණය අයදුම්කරුවන් 3596 දෙනෙකු වෙත රු.මි. 553.6 ක ණය නිකුත් කර ඇත.

මෙයට සමගාමීව 2024 වර්ෂය තුළ ණය ආපසු අයකර ගැනීම් වලද වර්ධනයක් දැකිය හැකි අතර ඒ අනුව, පෙර වර්ෂ යේ සියයට 2.5 වූ අක්‍රීය ණය ප්‍රතිශතය 2024 වර්ෂයේදී 1.9 දක්වා අඩුකරගැනීමට ආයතනය ක්‍රියාකර ඇත. තවද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 35.8 ක බදු ආදායමක් රජයට ලබා දී ඇති අතර මිලියන 82.5 ක බදු පසු ශුද්ධ ලාභයක් ඉපයීමට හැකි වී ඇති බවත් මේ අනුව 2023 වර්ෂයට සමගාමීව 2024 වසරේදී බදු පසු ශුද්ධ ලාභය 44%ක ප්‍රතිශතයකින් වර්ධනය වී ඇති බවත් මෙහි ළා සනිටුහන් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

2024 වසරේ දී දැක් වූ මෙම කැපී පෙනෙන ප්‍රගතිය හේතුවෙන් ණය සේවාව පුලුල් ප්‍රජාවක් වෙත සැපයීම හා අපේක්ෂිත මෙහෙයුම් කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් 2025 වර්ෂයේ ඵලදායි ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇත. ඒ අතරින්, ණය සැපයීමේ ගැටළු අවම කර කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ණය අයදුම් පත්‍රය හා ණය ක්‍රියාවළිය සමාලෝචනය කර සංශෝධනය කිරීම, ණය නිකුත් කිරීමට ගතවන කාලය දින 7 සිට දින 3 දක්වා අවම කිරීම, සෘජු ප්‍රේෂණ ක්‍රමය හරහා ණය අවකරණ ගෙන්වා ගැනීම තුළින් අරමුදල සහ ණයකරුවන්ගේ සේවා ආයතන අතර මූල්‍ය හුවමාරු නිශ්කාශන කටයුතු වඩාත් වේගවත්ව යාවත්කාලීන කර ගැනීමට ක්‍රියාකිරීම, ගෙවා අවසන් වූ ණය ගිණුම් පිළිබඳ තොරතුරු සන්නිවේදනය SMS - කෙටි පණිවිඩ මගින් ණයකරුවන් වෙත කඩිනමින් දැනුම් දීමට ක්‍රියාකිරීම මත අනවශ්‍ය ලෙස අතිරික්ත අවකරණ අරමුදල වෙත ගලා ඒම වැලැක්වීම, යන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම තුළ 2025 වසරේදී ඉහත සඳහන් ප්‍රගති නිර්නායකයන් හී තවදුරටත් සුවිශේෂී වර්ධනයක් ඇතිවිය හැකි බවට අපේක්ෂා කරමි.

මෙවන් සාධනීය ප්‍රගතිකයක් අත්කරගැනීම සඳහා අපේක්ෂිත මට්ටමින් මෙහෙයුම් කටයුතු සිදුකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ අප්‍රමාදව ලබාදෙමින් නිරන්තයෙන් අත්වැලක් සැපයූ අරමුදලේ භාරකාර මණ්ඩලයත් සියළු උපදෙස් හා මඟපෙන්වීම් සිදුකරන මුදල් අමාත්‍යාංශයේ නිලධාරී මඩුල්ලත් උපරිම කැපවීමකින් මෙහෙයුම් කටයුතු සිදුකරන අරමුදලේ කාර්යය මණ්ඩලයත් මෙකී සාර්ථකත්වයේ නියමුවන් සේ හැඳින්විය හැක.

අනාගතයේ දී මෙහි සේවාවන් තව තවත් ව්‍යාප්ත කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරන අතර අරමුදලේ පරමාර්ථවලට අනුගතව තවදුරටත් එම කාර්යයන් පුළුල් කිරීමට ආයතනයේ කාර්ය මණ්ඩලයට ශුභාසිංශන එකතු කරමි.

අයන්ති ද සිල්වා
පාලන භාරකාර

01. අරමුදලේ පසුබිම

1927 දී එවකට සිලෝන් ලෙස හැඳින්වූ මෙරට වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් පරිත්‍යාග කළ පවුම් 300 ක මුදලකින් ලෝහෝර් ආර්යා ණය අරමුදල ආරම්භ වී ඇත. රාජ්‍ය සේවකයින්ට කෙටි කාලීන මුල්‍ය ණය පහසුකම් ලබාදීම තුලින් ඔවුන් අනියම් හෝ අවිධිමත් ණය සපයන්නන් වෙත නැඹුරු වීම වැළැක්වීම මෙම අරමුදල පිහිටු වීමේ ප්‍රධාන අරමුණ විය. ආරම්භයේදී භාණ්ඩාගාර ගොඩනැගිල්ලෙහි පිහිටි මෙම අරමුදල, 1951 අංක 38 දරණ පනත මගින් නිල වශයෙන් ස්ථාපිත වූ පසු වසර 99 ක බදුකරයක් මත ලබා ගත් රජයේ ඉඩමක 1961 වර්ෂයේ ඉදි කරන ලද තෙමහල් ගොඩනැගිල්ලක මේ දක්වා පවත්වාගෙන යනු ලැබේ.



ජීන් ලෝහෝර් ආර්යාව

වර්තමානයේ මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ 45 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වන මෙම ව්‍යවස්ථාපිත වක්‍රීය අරමුදල වාර්ෂිකව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයින් 3500 – 4000 ත් අතර ප්‍රමාණයකට සහනදායී පොලී අනුපාතයක් යටතේ රු. 30,000/- සිට රු. 500,000/- දක්වා ණය පහසුකම් සලසා දෙනු ලැබේ. ඒ අනුව, වසරකට දළ වශයෙන් රු.මි. 650 කට ආසන්න මුදලක් ණය වශයෙන් රාජ්‍ය සේවකයින් වෙත නිකුත් කරනු ලැබේ. රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සැලකුණද මෙම අරමුදල වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන නොලබා ණය පොලී හා තෙවන පාර්ශවයන්ට අරමුදල් ගොඩනැගිල්ලෙහි මහල් කිහිපයක් බදුදීම මගින් ලැබෙන කුලී ආදායම යන ප්‍රධාන ආදායම් මූලාශ්‍ර හරහා අරමුදල කළමනාකරණය කරමින් පවත්වාගෙන යනු ලබයි.



ආරම්භක භාරකාර මණ්ඩලය - 1927

1.1 භාරකාර මණ්ඩලය

මෙම අරමුදල මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක මග පෙන්වීම හා අධීක්ෂණය වන අතර පනතෙහි ප්‍රතිපාදන අනුව භාරකාර මණ්ඩලය රැස්වූ අවස්ථාවල භාණ්ඩාගාර නියෝජිතවරයා එහි සභාපති ලෙස ක්‍රියා කරයි. ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ එක් භාරකාරවරයෙකු අරමුදලේ ප්‍රධාන විධායක වන පාලන භාරකාර ලෙස පූර්ණ කාලීන ව අරමුදල කළමනාකරණය කරයි.

02. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

ලෝහෝර් ආර්යා ණය අරමුදලෙහි අනුමත කාර්ය මණ්ඩලය 53 ක් වන අතර ඉන් 07 දෙනකු මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන් වේ. 2023 වර්ෂයෙහි අවසාන වන විට මෙම අරමුදලෙහි පැවති 42 ක් වූ තත්‍ය කාර්ය මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසාන වන විට 44 දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ දී මෙම තත්‍ය කාර්ය මණ්ඩලයෙන් දෙදෙනකු ජනාධිපති කාර්යාලය වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇත.

<u>පුරප්පාඩු පිරවීම</u>


2024 වර්ෂය දක්වා අරමුදල් කාර්ය මණ්ඩලයේ වරින් වර පැන නැඟුණු පුරප්පාඩු අරමුදලෙහි ප්‍රධාන කාර්ය භාරය ඉටු කර ගැනීමේ දී සැලකිය යුතු අභියෝගයක් ඇති කරන බව බොහෝ ප්‍රගති සමාලෝචන සාකච්ඡා වල දී පෙන්වා දුන් කරුණක් විය. ඒ අනුව, 2012 වර්ෂයේ සිට පැවති අරමුදලේ බඳවා ගැනීමේ පටිපාටිය වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් ආයතනයේ පුරප්පාඩු පිරවීමටත් 2024 වර්ෂයේ දී ප්‍රමුඛතාව ලබාදෙන ලදි.

ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ සහකාර III තනතුර සඳහා නව නිළධාරීන් 04 දෙනකු බඳවාගත් අතර එය ආයතයේ කාර්ය සාධන වර්ධනයට ඉමහත් සහායක් විය.

එමෙන්ම, වසර ගණනාවක් පුරාවට අරමුදලේ කාර්ය සාධනය සඳහා අත්‍යවශ්‍යව තිබූ ණය අධීක්ෂණ නිළධාරී තනතුර අරමුදල් සංවිධාන ව්‍යුහය තුල ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය 2024 වර්ෂයේදී ලද බැවින්, ආයතනයේ කළමණාකරන සහකාර I ණය අධීක්ෂණ තනතුර සඳහා උසස් කිරීමට හැකි වීම ණය සේවාව සැපයීමට හා ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීමට ගත් තවත් එක් සාධනීය පියවරකි. මේ හැර 2020 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති තොරතුරු තාක්ෂණ විෂය සඳහා කණිෂ්ඨ කළමණාකරුවකු සේවයට බඳවා ගැනීමට හැකි වීම ද විශේෂ කාර්ය සාධනයකි.

2024 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව 2024.12.31
ගණකාධිකාරි	01	01
පරිපාලන නිලධාරි	01	01
ගිණුම් නිලධාරි	01	-
අභ්‍යන්තර විගණක නිලධාරි	01	01
ණය අයකර ගැනීමේ නිලධාරි	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරි	01	01
ණය අධීක්ෂණ නිලධාරි	01	01
කළමනාකරණ සහකාර	35	29
ගොඩනැගිලි අධීක්ෂණ	01	-
කාර්යාල කාර්ය සහායක	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක	01	01
රියදුරු	02	02
එකතුව	53	44



2.1 සංවිධාන ව්‍යුහය

<u>කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම</u>.

ආයතනයෙහි කාර්යාලීය ක්‍රමවේදයන් හා පටිපාටිය අනුව පහත ක්‍රියාකාරකම් 2024 වර්ෂයේ දී සිදු කරන ලද අතර ඒ තුලින් ආයතනයේ පරිපාලනයේ කාර්යක්ෂමතාව වර්ධනය කරන ලදී.

- ❖ කාර්යාලයෙන් අපහරණය කරන ලද කඩදාසි, පැරණි පුවත් පත් සහ ප්ලාස්ටික් කැන් විකිණීම.

<u>ගොඩනැගිලි පරිශ්‍ර පාලනය.</u>

99 වර්ෂයක බදු කාල සීමාවක් සඳහා ලබාගෙන ඇති ඉඩමෙහි ගොඩනගන ලද තෙමහල් ලෝහෝර් ආර්යා ගොඩනැගිල්ල බාහිර පාර්ශව 06 කට බදු කුලී පදනම මත ලබා දී ඇත.

මෙම ආයතන වලින් ලැබෙන වාර්ෂික බදුකුලීය ආයතනයේ පරිපාලන වියදම් කළමනාකරණය කර ගැනීමේ ප්‍රධාන ඉපැයීම් මාර්ගය වේ. ඒ අනුව, එක් එක් කුලී පාර්ශවයන් සමග එළඹ ඇති කුලී ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිලි පරිශ්‍රයේ නඩත්තු සහ අත්‍යාවශ්‍ය අලුත් වැඩියා කටයුතු සඳහා 2024 වර්ෂයේ ද ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. මේ යටතේ පහත අලුත් වැඩියා කටයුතු 2024 වර්ෂයේ දී සිදු කරන ලදි.

- ➢ අරමුදල් කාර්යාලයේ විදුලි තත් ඇදීමේ කාර්යය අවසන් කිරීම.
- ➢ අංක 100 ගොඩනැගිලි පරිශ්‍රය බදු කුලියට ගෙන සිටින ජාතික ඉතිරි බැංකු ශාඛා ගොඩනැගිලි පරිශ්‍රයේ පවතින අඩුපාඩු අලුත්වැඩියාව ආරම්භ කිරීම.

අනු අංකය	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය
1	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 - මහල	5500
2	රථ ගාල	පතුල් මහල	5290
3	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500
4	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415
5	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700
6	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750
7	Office Equment (pvt) Ltd	2 - මහල	840
8	MAA ඇසෝසියේට්ස්	අංක :100/20	380
			27375

<u>භාරකාර මණ්ඩල රැස්වීම්</u>

1951අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත අනුව අරමුදලෙහි ප්‍රධාන විධායක ධූරය වන "පාලන භාරකාර" ඇතුළු භාරකාර මණ්ඩලය සාමාලෝචිත වර්ෂය තුල නව වතාවක් රැස්වූ අතර ආයතනයේ කාර්ය සාධනය සඳහා ඉවහල් වන පහත ප්‍රතිපත්ති තීරණ රැසක් ක්‍රියාවට නැංවීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්</u>

1. කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025 වලට අනුකූලව 2024 වසරේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වන ලදි. අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, පහත දැක්වෙන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විගණන විමසුම් වාර්තා 14ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉදිරිපත් කර ඇත. එමෙන්ම, එම විමසුම් සම්බන්ධයෙන් පහත දැක්වෙන වැදගත් තීරණ භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

   i. ප්‍රතිපත්ති තීරණ වෙනස්වීම මත අරමුදලෙහි ණය ක්‍රියාවලියට සිදුවන අනෙකුත් බලපෑම් සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය.
   ii. අරමුදල පරිපාලනයේදී ආයතන සංග්‍රහයේ අදාල කරගත හැකි විධිවිධාන වාර්තා කිරීමේ අවශ්‍යතාවය.
   iii. පරිපාලන මෙහෙයුම් අත්පොත යාවත්කාලීන කර පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය.
   iv. ණය වාර්තාවල දෝෂ ඇති නොවන සේ පරිගණක පද්ධතිය නිවැරදි කිරීමේ අවශ්‍යතාවය.
   v. කුළිබදු ගිවිසුම් අළුත් කිරීමේ කටයුතු කාලීනව සිදුකිරීමේ අවශ්‍යතාවය.
   vi. කල් පසුවූ අක්‍රිය ණය ගිණුම් සඳහා කාලීනව පියවර ගැනීමේ අවශ්‍යතාවය.

03. ණය අරමුදල් සැපයීමේ කාර්ය සාධනය

ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතෙහි පරමාර්ථයන්ට අනුව, රාජ්‍ය සේවකයින්ගේ අවිධිමත් ණය බර ලිහිල් කිරීම සඳහා ණය සැපයීම තුලින් රාජ්‍ය සේවාව කාර්යක්ෂම කිරීමට පිටුවහලක් වීම මෙම අරමුදලේ කාර්ය භාරය වේ. ඒ අනුව, අරමුදලේ ඉදිරි වර්ෂ 05 සඳහා නිර්මිත සංයුක්ත සැලැස්මට අනුව, වර්ෂයකට දළ වශයෙන් රාජ්‍ය සේවකයින් 4000 කට රු.මි. 500 ක පමණ ණය සේවා සැපයෙන අතර රාජ්‍ය සේවකයින්ගේ වැටුපෙහි 40% ක සීමාවට අනුව ණය මුදල තීරණය වේ.

3.1 2024 වසරේ ප්‍රතිලාභීන්

2024 වසරේදී රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු රාජ්‍ය සේවකයින් 3596 ක් මෙම අරමුදලේ නවක ප්‍රතිලාභීන් වී ඇත. ඒ අනුව, 2024 වර්ෂයේ දී ණය පද්ධතිය තුල සිටි සක්‍රීය සමුච්චිත ණය ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 8567 කි.

සමාලෝචිත වර්ෂයේ ණය සැපයුම් සංඛ්‍යාන දත්ත වලට අනුව සමස්ථ ණය සංඛ්‍යාවෙන් 66% ක්ම ලබාගෙන ඇත්තේ බස්නාහිර පළාතෙන් බැහැරව සේවය කරන නිළධාරින් විසිනි. සාමාන්‍යයෙන් උතුරු හා නැගෙනහිර පළාත් රාජ්‍ය ආයතන වල රාජ්‍ය සේවකයින් විසින් ණය ලබා ගැනීමේ ඉතා අඩු ප්‍රවණතාවයක් පිළිඹිබු වන අතර දුර ප්‍රමාණය, මාර්ග ගත සන්නිවේදන අපහසුතාව යන කරුණු ඒ සඳහා හේතු විය හැක. 2024 වර්ෂයේදී සැලකිය යුතු ණය ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ පොලිස් සහ ආරක්ෂක අංශයේ නියුතු නිළධාරින් විසින් වන අතර එය සමස්ථ ණය ප්‍රතිලාභී සංඛ්‍යාවෙන් 77% කි.

රාජ්‍ය සේවකයින්ගෙන් ණය සඳහා ඉදිරිපත් වූ අයදුම්පත්‍ර සංඛ්‍යාව හා ණය නිකුත් කිරීමේ දත්ත අනුව 2024 වසරේ සුදුසුකම් නොලැබීම හේතුවෙන් සක්‍රීය නොවූ ණය අයදුම්පත් සංඛ්‍යාව 100 ක් පැවතුණු අතර එම අයදුම්පත් වලින් වැඩි ප්‍රතිශතයක් එනම්, 60% ක් ප්‍රතික්ෂේප වීමට බලපෑ හේතූන් ලෙස වැටුපෙන් 40% ක් ඉක්මවා බැඳීම්/වගකීම් පැවතීම, විශ්‍රාම වයස් සීමාව ආසන්නයේ සිටීම, ඇපකර සඳහා සමාන්තර ශ්‍රේණි වල නිළධාරින් නොමැති වීම, යන කරුණු බලපා ඇති බව ණය අංශයේ වාර්තා මගින් පෙන්නුම් කරයි.

3.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

1. විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථීර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.

2. අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථීර සේවා කාලයක් සපුරා තිබීම.


3. ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.

4. අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.

5. අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථීර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවයේ නියුතු අයකු වීම.


6. සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

3.3 ණය අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට බලපාන හේතු



2023/2024 වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව


දිස්ත්‍රික්කය	2024	2023	දිස්ත්‍රික්කය	2024	2023
කොළඹ	433	581	අනුරාධපුරය	203	181
ගම්පහ	436	563	පොළොන්නරුව	91	70
කළුතර	290	315	වව්නියාව	3	8
මහනුවර	246	232	මුලතිව්	1	1
නුවරඑළිය	73	52	මන්නාරම	0	0
මාතලේ	103	66	යාපනය	0	0
ගාල්ල	242	194	කිලිනොච්චිය	0	0
මාතර	129	122	රත්නපුර	141	129
හම්බන්තොට	89	84	කෑගල්ල	255	206
ත්‍රිකුණාමලය	12	12	කුරුණෑගල	406	352
මඩකලපුව	5	3	පුත්තලම	55	30
අම්පාර	81	53	බදුල්ල	164	157
			මොනරාගල	138	85
			එකතුව	3596	3496



3.4 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම


2024 වර්ෂයේ ණය මුදල් නිකුත් කිරීම.

උපරිම ණය සීමාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය මුදල් වටිනාකම (රු.මි.)
200,000	345	69.0
175,000	2,068	361.9
150,000	203	30.5
100,000	829	82.9
75,000	79	5.9
50,000	56	2.8
40,000	13	0.5
30,000	3	0.09
එකතුව	3,596	553.6



සමාලෝචිත වර්ෂයේදී වැඩි ඉල්ලුමක් ලැබී ඇත්තේ රු.175,000/- ණය කාණ්ඩය සඳහා වේ. එමෙන්ම, රු. 50,000/- ට වඩා අඩු ණය කාණ්ඩය යටතේ 72 දෙදෙනකු වෙත ණය නිකුත් කර ඇත. 2024 වර්ෂයේ දී සමස්ථ ණය නිකුත් කිරීම පසුගිය වර්ෂය හා සසඳන විට 23.65% ක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇත.

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු. 000)
2021	901	136,725
2022	2705	484,140
2023	3496	447,680
2024	3596	553,585



3.5 ණය අයකර ගැනීමේ ප්‍රගතිය

2021 සිට 2024 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය වගුවෙන් පෙන්නුම් කෙරේ. ඒ අනුව, 2024 වර්ෂයේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය පසුගිය වර්ෂයට සාපේක්ෂව 56% ක වර්ධනයක් ලබා ඇත.

වර්ෂය	ණය අයකර ගැනීම (රු. 000)
2021	341,582
2022	267,060
2023	409,221
2024	637,676

<u>ඉඩම් ඔප්පු සහ ඇප බැඳුම්කර</u>


ලෝහෝර් ආර්යා ණය අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් ඔප්පු සහ ඇප බැඳුම්කර මත රාජ්‍ය සේවකයින් සඳහා ණය නිකුත් කිරීම සිදු වී ඇතත් කාලයත් සමග මෙම ක්‍රමය පුද්ගල ඇප මත ණය ලබා දීමේ ක්‍රමයට පරිවර්ථනය වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැඳුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයෙහි වගකීමක්ව පවතී. කෙසේ වුවද, මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවේ. එබැවින්, විධිමත් විගණන කම්ටු නිර්දේශයකින් අනතුරුව, අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ වල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වලට එම බැඳුම්කර නිදහස් කර ඒවායේ සඳහන් වන පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතන වෙතට පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 හාරකාර මණ්ඩල විසින් අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වුවද මේ දක්වා බැඳුම්කර 267 න් බැඳුම්කර 191 නිදහස් කර ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර නිදහස් කිරීමක් සිදු වී නොමැත.

ඇවර කරන ලද ණය සහන සභාවට අදාල ඇප/ බැඳුම්කර/ ඔප්පු සම්බන්ධ දැන්වීම / අයදුම්පත සහ භාණ්ඩාගාරය තහවුරු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළයුතු දිවුරුම් ප්‍රකාශය යන ලේඛන ත්‍රෛයි භාෂාවෙන් අරමුදලේ වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරන ලදී.

3.6 ආදායම් උත්පාදනය

3.6.1 ණය පොළී ආදායම.

රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති මත වෙළඳපොළ බැංකු ණය පොළී අනුපාතය අඩු කළ විගසම අරමුදලේ පොළී අනුපාතය ද අඩු කිරීමට යටත්ව ණය පොළී ප්‍රතිශතය අඩු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ ජනවාරි 01 වන දින සිට අරමුදලේ ණය පොළී ප්‍රතිශතය පෙර වර්ෂයේ පැවති 15% සිට 13% දක්වා අඩු කරන ලදී. එසේ පොළී ප්‍රතිශතය අඩු කලද සමාලෝචිත වර්ෂයේ ණය පොළී ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව 58.8% ක වර්ධනයක් ලබා ඇති අතර එය ණය නිකුත් කිරීමේ විශිෂ්ඨ කාර්ය සාධනයක් පෙන්නුම් කරයි.



3.6.2 කාර්යාල සංකීර්ණයේ කුලී ආදායම

ලෝහෝර් ආර්යා තෙමහල් ගොඩනැගිල්ල බාහිර පාර්ශවයන් සඳහා බදු කුලී පදනම මත ලබා දීම තුලින් ලැබෙන වාර්ෂික බදුකුලීය ආයතනයේ තවත් එක් ප්‍රධාන ඉපැයීම් මාර්ගය වේ. ඒ අනුව, එක් එක් කුලී පාර්ශවයන් මගින් වර්ග අඩි 16585 ක අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය සඳහා 2024 වර්ෂය තුල උපයාගත් කුලී ආදායම රුපියල් මිලියන 22.22 කි.

2024 වසරේ ගොඩනැගිලි කුලී ආදායම

අනු අංකය	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම(රු.)
1	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	8,700,000
2	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,978,817
3	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700	6,250,000
4	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	3,600,000
5	Office Equipment (pvt) Ltd	2 - මහල	840	459,578
7	MAA ඇසෝසියේට්ස්	අංක :100/20	380	240,000
			16585	22,228,395

3.6.3 ආයෝජන ආදායම

ලෝහෝර් ආර්යා වක්‍රීය ණය අරමුදලේ ණය නිකුත් කිරීමේ කාර්යය තුල අඛණ්ඩව සක්‍රීය නොවන අවස්ථා වල එම මුදල් රාජ්‍ය බැංකු තුල කෙටි කාලීනව ආයෝජනය කිරීමෙන් ලබා ගන්නා පොළියද අරමුදලේ එක් ආදායම් උත්පාදන මාර්ගයක් වේ. ඒ අනුව, 2024 වර්ෂයේදී මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුල කෙටි කාලීන ස්ථාවර තැන්පතු වශයෙන් රු.මි. 132.8 ක් ආයෝජනය කර ඇති අතර එම ආයෝජන වටිනාකම 2023 වර්ෂයට සාපේක්ෂව 26.6% වර්ධනය වී ඇත. සමාලෝචිත වර්ෂයේ මෙම ආයෝජන තුලින් උපයා ගන්නා ලද පොළී ආදායම රු.මි. 8 කි. එම වටිනාකම පෙර වර්ෂයේ ආයෝජන පොළී ආදායමට වඩා 67.6% ක පහළ ගොස් ඇත.


ආයෝජන වර්ගය	බැංකුව	2024/12/31 දිනට ආයෝජන මුදල් වත්කම් (රු.)	2024/12/31 දිනට පොළී ආදායම (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	72,000,000.00	8,032,479.86
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	60,816,191.85	
එකතුව		132,816,191.85	

3.6.4 මෙහෙයුම් ආදායම

ඒ අනුව, 2024 වසර තුලදී සමස්ථ මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 185.4 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 82.5 ක් විය. 2023 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 145.1 ක් හා රුපියල් මිලියන 57.4 ක් ලෙස දක්නට ඇත. 2024 වසරේදී 2023 වසරට සාපේක්ෂව 43.7% ක ලාභදායීත්වයේ වර්ධනයක් අත්කර ගැනීමට අරමුදලට හැකිවී ඇත.

3.6.5 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරයේ හෝ ජාතික අයවැය ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සියළුම පොදු කාර්යය හා ප්‍රාග්ධන වියදම් ද ණය නිකුත් කිරීමේ ප්‍රතිපාදන ද මෙම අරමුදල මගින් උපයනු ලබන පොළී ආදායම් හා අනෙකුත් ආදායම් මගින් ආවරණය කර ගැනීමෙන් අනතුරුව අඛණ්ඩව වාර්ෂිකව ලාභදායීත්වයකින් යුක්තව පවත්වාගෙන යාමට හැකි වී ඇත.



04. අනාගත සැළසුම්

2025 වර්ෂයේ සිට ආරම්භ කර මේ වන විටත් ක්‍රියාත්මක කෙරමින් පවතින ලෝහෝර් ආර්යා අරමුදල පස් අවුරුදු සමායතන සැලසුමෙහි යෝජිත උපායමාර්ග වල අරමුණ වන්නේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, ණය සේවා විවිධාංගීකරණය සහ ඉදිරි වසර 5ක් සඳහා මූල්‍ය ස්ථායීභාවය සුරක්ෂිත කිරීමයි. නවීන තාක්ෂණයන් යොදා ගනිමින්, සම්පත් උපයෝගීතාව වැඩිදියුණු කරමින් සහ නව අභියෝග හඳුනාගෙන ඒවාට පිළියම් සපයමින්, රාජ්‍ය සේවකයින් සඳහා විශ්වාසනීය ආයතනයක් ලෙස තම ස්ථානය ශක්තිමත් කර ගැනීම සහ තරඟකාරී වර්තමාන පරිසරයකදී අනාගතය සුරක්ෂිත කර ගැනීම සඳහා LLLF අරමුදල පහත පරිදි සැළසුම් කරනු ලැබේ.

(1) රජයේ වර්තමාන ඩිජිටල්කරණ ප්‍රතිපත්තියට අනුව හා ණය ක්‍රියාවලිය කාර්යක්ෂම හා සරල අරමුණු කරගනිමින් ණය අරමුදල සඳහා නව ණය කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරීම.
රාජ්‍ය සේවාව ඩිජිටල්කරණය කිරීමේ රජයේ වර්තමාන ප්‍රතිපත්තියට හා ණය ක්‍රියාවලිය කාර්යක්ෂම හා සරල කිරීම අරමුණු කර ගනිමින් ණය අරමුදල සඳහා නවීන ණය කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරීම.

(2) වර්තමාන අභියෝගවලට සාර්ථකව මුහුණ දීම හා දිගුකාලීන තිරසාරභාවය හා විනිවිදභාවය සහතික කිරීම සඳහා අරමුදල් පනතට සංශෝධනයන් එකතු කිරීම.

(3) ආයතනික පරිපාලනය විධිමත් කිරීම , ණය ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා අනාගත සැලසුම් හා අවිනිශ්චිතතා පුරෝකථනය කරමින් මෙන්ම ණය සේවා සැපයීම් ව්‍යාප්ත කිරීමට උචිත වන පරිදි සේවක හා තනතුරු සංඛ්‍යාව සමාලෝචනය කර නව අවස්ථා හඳුන්වා දීම.

(4) ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විධාන හා රීති ඇතුලත්ව මෙහෙයුම් මාර්ගෝප දේශකයක් සකස් කිරීම.

(5) පවතින ණය ක්‍රියාවලිය සරල කිරීම.

(6) දැනට පවතින ණය අරමුදල තර කිරීම, ණය කළඹ පුළුල් කිරීම හා ණය ක්‍රමවේද විවිධාංගිකරණය කිරීම.

(7) 1960 වසරේ සිට මෙම ආයතනයේ වගකීමක් වූ අරමුදල යටතේ පවතින ඇප ඔප්පු බැදුම්කර 176 ක් නිදහස් කිරීම.

05. අරමුණු සපුරාලීමට පවතින අභියෝග

ලෝහෝර් ආර්යා ණය අරමුදල වසර 99 ක්ම රාජ්‍ය සේවකයාට ඇති මූල්‍ය පීඩනය දරා ගැනීම සඳහා මූල්‍ය සහාය සපයන සහකරුවකු ලෙස පිළිගැනීමක් ඇති විශාල පාරිභෝගිකයන් පිරිසක් ඇති රාජ්‍ය ආයතනයක් වුවද, වර්තමානයේ එහි පාරිභෝගික පදනම තීරණය වී ඇත්තේ විශ්‍රාම වැටුප් හිමිකම මතය. විශ්‍රාම වැටුප් හිමිකම නොමැති රාජ්‍ය සේවකයන්ට ණය ලබා දීම තුල ණය අය කර ගැනීමේ අවධානමක් සහිතවීම.

අරමුදෙලහි මූල්‍ය ධාරිතාවය තීරණය වීමට බලපාන ප්‍රධානතම සාධකය වන ණය පොළිය තීරණය වනුයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මත වන අතර මෙම අරමුදල සඳහා වාර්ෂිකව භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් අරමුදල් වෙන්කිරීමට හෝ රාජ්‍ය ණය ලබා ගැනීමට අවස්ථාවක් නොමැත. එවන් පසුබිමක අරමුදල තරකිරීම හා එහි දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීම ඉතා අභියෝගාත්මක වේ.

මූල්‍ය ආයතනයක් ලෙස වර්ගීකරණය වීමේ අවදානම, අනම්‍ය නියාමන නීති රීති, ඉහළ අනුකූල පිරිවැය, සහ ණය නිකුත් කිරීමේ ලිහිල්භාවය අඩු වීම.

06. ස්වාධීන විගණකගේ වාර්තාව

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ සාමාජිකයින් වෙත ස්වාධීන විගණක වාර්තාව

Dayananda Samarawickrema & Co.,

CHARTERED ACCOUNTANTS

Partners
K.G. Chandana Kumara FCA, ACMA, FMAAT
T.H. Dharmasena FCA, BA
M.G.K. Ravindra FCA, ACMA

No. 19C, St. Joseph's Road,
Nugegoda, Sri Lanka.
Tele : 2854614, 2809650, 2822940,
E-mail : dsandco@sltnet.lk
Web : www.dsandco.lk

INDEPENDENT AUDITOR'S REPORT TO THE MEMBERS OF LADY LOCHORE LOAN FUND

We have audited the accompanying Financial Statements of **Lady Lochore Loan Fund**, Which comprise the Statement of Financial Position as at 31st December 2024 and the Statement of Comprehensive Income and Cash Flow Statement for the year than ended, and a summary of Significant Accounting Policies and other Explanatory Notes.

Management's Responsibility for the Financial Statements

Management is responsible for the preparation and fair presentation of these Financial Statements in accordance with Sri Lanka Public Sector Accounting Standards (SLPSAS), and for each internal control as Management determines is necessary, to enable the preparation of Financial Statements that are from material misstatements, whether due to fraud or errors.

Auditor's Responsibility

Our responsibility is to express an opinion on these Financial Statements based on our audit. We conducted our audit in accordance with Sri Lanka Auditing Standards. Those standards require that we comply with ethical requirements and plan and perform the audit to obtain reasonable assurance as to whether the Financial Statements are free from material misstatements.

An audit involves performing procedures to obtain audit evidence about the amounts and disclosures in the Financial Statements. The procedures selected depend on the Auditor's judgment, including the assessment of the risks of material misstatement of the Financial Statements, whether due to fraud or error. In making those risks assessments, the Auditor considers internal control relevant to the entity's preparation and fair presentation of the Financial Statements in order to design audit procedures that are appropriate in the circumstances, but not for the purpose of expressing an opinion on the effectiveness of the entity's internal control. An audit also includes evaluating the appropriateness of accounting policies used and the reasonableness of accounting estimates made by Management, as well as evaluating the overall presentation of the Financial Statements.

We believe that the audit evidence we have obtained is sufficient and appropriate to provide a basis for our audit opinion.

Opinion

In our opinion, the Financial Statements present fairly, in all material respects, the financial position of Lady Lochore Loan Fund as at 31st December 2024 and its financial performance and its Cash Flows for the year then ended, Sri Lanka Public Sector Accounting Standards (SLPSAS).

DAYANANDA SAMARAWICKREMA & CO.,
Chartered Accountants
Nugegoda.
08.10.2025

Dayananda Samarawickrema & Co. No. 19 C, St. Joseph's Road, Nugegoda. Chartered Accountants

07. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන්	2024	2023
		රු. ශත.	රු. ශත.
ආදායම	03	**153,361,708.44**	96,967,815.00
වෙනත් ආදායම්	04	**32,048,223.05**	48,103,063.00
		185,409,931.49	145,070,878.00
මෙහෙයුම් වියදම්			
පරිපාලන සහ වෙනත් මෙහෙයුම් වියදම්	05	**(67,004,995.13)**	(61,372,508.00)
මූල්‍ය වියදම්	06	**(54,600.56)**	(22,337.00)
		(67,059,595.69)	(61,394,845.00)
බදු පෙර ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)		**118,350,335.80**	83,676,033.00
ආදායම් බදු වියදම්	07	**(35,810,053.98)**	(26,277,492.49)
බදු පසු ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)		**82,540,281.82**	57,398,540.51

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් ලෙස සැලකිය යුතුය. වරහන් තුලින් දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් සිදු කරයි.



08. මූල්‍ය තත්ව ප්‍රකාශනය

		31.12.2024	31.12.2023
වත්කම්	සටහන්	රු. ශත.	රු. ශත.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	08	**80,261,899.32**	82,815,709.00
ආයෝජන (දේපළ)	09	**22,285,710.41**	23,276,187.00
		102,547,609.73	106,091,896.00
ජංගම වත්කම්			
ස්ථාවර තැන්පතු ආයෝජන	10	**132,816,191.76**	97,497,665.00
තොග වත්කම්	11	**657,380.85**	1,273,701.12
වෙනත් ලැබිය යුතු දෑ	12	**6,803,487.72**	5,837,524.00
ණය සහ අත්තිකාරම්	13	**710,815,038.79**	638,174,738.71
මුදල් සහ මුදල් සමාන දෑ	14	**14,828,053.34**	27,095,541.00
		865,920,152.46	769,879,169.83
මුළු වත්කම්		**968,467,762.19**	875,971,065.83
අරමුදල් සහ සංචිත			
ප්‍රත්‍යාගණන සංචිත		**146,649,586.00**	146,649,586.00
සමුච්චිත අරමුදල		**761,817,393.31**	679,102,145.51
මුළු අරමුදල් සහ සංචිත		**908,466,979.31**	825,751,731.51
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	15	**23,752,687.00**	24,043,956.20
		23,752,687.00	24,043,956.20
ජංගම වගකීම්			
අනෙකුත් ජංගම වගකීම්	16	**15,456,207.88**	12,308,953.00
ගෙවිය යුතු ආදායම් බදු	17	**20,791,888.00**	13,866,425.12
		36,248,095.88	26,175,378.12
මුළු අරමුදල් සහ වගකීම්		**968,467,762.19**	875,971,065.83

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ.

ගණකාධිකාරී

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

පාලන භාරකාර

සභාපති

දිනය : 2025 ඔක්තොම්බර් 8

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් ලෙස සැලකිය යුතුය. වරහන් තුලින් දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම් සිදු කරයි.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල්	ප්‍රත්‍යාගණන සංචිත	අරමුදල් සහ සංචිත
	රු. ශත.	රු. ශත.	රු. ශත.
01.01.2023 දිනට ශේෂය	621,694,922.00	146,649,586.00	768,344,508.00
පෙර වර්ෂයේ ගැලපීම්	8,683.00	-	8,683.00
වසරේ ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)	57,398,540.51	-	57,398,540.51
31.12.2023 දිනට ශේෂය	679,102,145.51	146,649,586.00	825,751,731.51
01.01.2024 දිනට ශේෂය	**679,102,145.51**	**146,649,586.00**	**825,751,731.51**
පෙර වර්ෂයේ ගැලපීම්	**174,965.98**	-	**174,965.98**
වසරේ ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)	**82,540,281.82**	-	**82,540,281.82**
31.12.2024 දිනට ශේෂය	**761,817,393.31**	**146,649,586.00**	**908,466,979.31**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් ලෙස සැලකිය යුතුය. වරහන් තුලින් දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම සිදු කරයි.



09. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024	2023
	රු. ශත.	රු. ශත.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ		
බදු ගෙවීමට පෙර ශුද්ධ අතිරික්තය/(හිඟය)	118,350,335.80	83,676,033.00
ගැලපීම් සඳහා		
ක්ෂයවීම්	4,289,248.69	4,088,798.15
ණය ආපසු ගෙවීම	990,476.59	990,477.00
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	548,300.00	3,551,926.40
පෙර වසරේ ගැලපීම	174,965.98	8,683.00
ඉතුරුම් මත පොලී ආදායම	(1,005,860.30)	(1,695,738.00)
ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම	(8,032,479.96)	(24,701,680.00)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**115,314,986.80**	65,918,499.55
තොගයේ (වැඩි වීම්)/අඩුවීම්	616,320.27	(188,265.21)
ණය සහ අත්තිකාරම් (වැඩි වීම්)/අඩුවීම්	(72,640,300.08)	9,105,940.94
අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩි වීම්)/අඩු වීම්	(965,963.72)	(137,244,257.13)
අනෙකුත් වගකීම්වල වැඩිවීම් / (අඩුවීම්)	3,147,254.61	(2,263,940.08)
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්	**45,472,297.88**	(64,672,021.93)
ගෙවන ලද පාරිතෝෂිකය	(839,570.00)	(2,087,730.20)
බදු ගෙවීම්	(28,884,590.84)	(22,690,469.15)
(භාවිතා කරන ලද) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**15,748,137.04**	(89,450,221.28)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහය	-	-
ශුද්ධ මුදල් ප්‍රවාහය / (භාවිතා කරන ලද) ආයෝජන ක්‍රියාකාරකම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහය		
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අත්පත් කර ගැනීම	(1,735,438.20)	(7,119,294.91)
(ආයෝජන)/ස්ථාවර තැන්පතු වලින් මුදල් ආපසු ගැනීම	(35,318,526.76)	85,109,495.19
ලද පොලිය	9,038,340.26	26,397,418.00
ශුද්ධ මුදල් ප්‍රවාහය / (භාවිතා කරන ලද) මූල්‍යකරණ ක්‍රියාකාරකම්	**(28,015,624.70)**	104,387,618.28
මුදල් සහ මුදල් සමානදේ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)	(12,267,487.66)	14,937,397.00
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ	27,095,541.00	12,158,144.00
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ (සටහන A)	**14,828,053.34**	27,095,541.00

සටහන - A

මුදල් සහ මුදල් සමානතා විශ්ලේෂණය	2024.12.31	2023.12.31
	රු. ශත.	රු. ශත.
මහජන බැංකුව- ඉතිරිකිරීමේ ගිණුම අංක 204 200 2300 85389	7,596,139.29	18,373,088.00
මහජන බැංකුව - ජංගම ගිණුම අංක 204100 1600 85389	5,909,147.21	5,740,999.00
මහජන බැංකුව - ජංගම - ගිණුම් අංකය 204100 1800 85388	1,132,481.56	1,525,379.00
මහජන බැංකුව - ජංගම - ගිණුම් අංකය 204100 2500 85389	170,285.28	1,436,692.00
අතැති මුදල්	20,000.00	19,383.00
	14,828,053.34	27,095,541.00

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් ලෙස සැලකිය යුතුය. වරහන් තුලින් දක්වා ඇති සංඛ්‍යා අඩු කිරීම සිදු කරයි.

Dayananda Samarawickrema & Co
No. 19 C,
St. Joseph's Road,
Nugegoda.
Chartered Accountants

10. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

10.1 සාමාන්‍ය තොරතුරු

1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (හාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නිත්‍යවාසික අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 <u>අනුකූලතා ප්‍රකාශණය</u>
මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPAS)

1.2 <u>මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම</u>

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා හාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 <u>පිළියෙල කිරීමේ පදනම</u>

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 <u>ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්</u>

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍ය තැන්හී මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 <u>බදු</u>

<u>වර්තමාන බදු</u>
මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මුලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 <u>ආනුශංගික තොරතුරු</u>

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.



10.2 වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම

2.1 <u>බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන</u>

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදී ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 <u>ස්ථාවර තැන්පතු</u>

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 <u>දේපල පිරියත සහ උපකරණ</u>

දේපල පිරියත සහ උපකරණ මිලදී ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
පරිගණක උපකරණ	25%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
කාර්යාල උපකරණ	10%
විද්‍යුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම් පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදී භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම් සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුලදී ද ක්ෂය කිරීම් සිදු නොකරන ලදි.

2.4 <u>අනෙකුත් ලැබිය යුතු දෑ</u>

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශණය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 <u>මුදල් හා ඒ සමාන දෑ</u>

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

2.6 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

2.6.1 <u>ප්‍රාග්ධන බැඳීම්</u>

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

Dayananda Samarawickrema & Co.
No. 19 C,
St. Joseph's Road,
Nugegoda.
Chartered Accountants

2.6.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

2.6.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල.

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

2.7 ආදායම් ප්‍රකාශනය

ආදායම් හඳුනා ගැනීම

2.7.1 ණය පොළී ආදායම

ණය පොළී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

2.7.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

2.7.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අඛන්ඩව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

Dayananda Samarawickrema & Co.
No. 19 C,
St. Joseph's Road,
Nugegoda.
Chartered Accountants

11. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024

සටහන 03 - ආදායම	2024	2023
	රු. ශත.	රු. ශත.
ණය සමාගම සහ සංස්ථාව මත පොළිය	152,373,917.72	95,948,787.00
කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය 11.5% (250,000).	462,729.18	570,683.00
නව කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය 4.5%	265,881.64	308,510.00
ටැබ් ණය සඳහා පොළිය	60,473.98	65,461.00
කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය 11.5% (100,000)	195,176.38	71,652.00
පාපැදි ණය සඳහා පොළිය	740.34	1,401.00
විශේෂ අත්තිකාරම් සඳහා පොළිය	2,789.20	1,321.00
	153,361,708.44	96,967,815.00

සටහන 04 - අනෙකුත් ආදායම්		
	රු. ශත.	රු. ශත.
ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම	8,032,479.96	24,701,680.00
කුලී ආදායම	22,228,395.48	19,810,613.00
ඉතුරුම් මත පොළී ආදායම	1,005,860.30	1,695,738.00
ණය අලාභ ප්‍රතිපාදන ආපසු ගෙවීම	-	847,715.00
ණය අයදුම්පත් විකිණීමෙන් ලද ආදායම	437,400.00	564,900.00
විවිධ ආදායම්	307,877.31	292,592.00
වෙනත් ආදායම්	36,210.00	189,825.00
	32,048,223.05	48,103,063.00



සටහන 05 - පරිපාලනය සහ අනෙකුත් මෙහෙයුම් වියදම්

	2024	2023
	රු. ශත.	රු. ශත.
වැටුප්	18,344,265.70	18,263,477.00
විශේෂ දීමනා	4,964,343.15	4,778,389.00
කාර්ය මණ්ඩල දීමනා	8,645,089.78	3,928,080.00
පාරිතෝෂික හා ප්‍රතිපාදන සඳහා	548,300.80	3,551,926.00
කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල් මණ්ඩල කොටස	4,323,920.13	3,541,088.00
දීමනා - පාලන භාරකරු	2,448,749.97	2,458,942.00
වාර්ෂික ප්‍රසාද දීමනාව	1,025,000.00	642,292.00
සේවක භාර අරමුදල් සඳහා මණ්ඩල කොටස	810,735.03	663,954.00
දීමනා - භාරකාර මණ්ඩල සාමාජිකයින්	488,940.40	516,663.00
සභාපති දීමනා	408,136.70	399,457.00
කරුණාසහගත දීමනා	17,500.00	166,200.00
දීමනා - විගණන කමිටුව	123,290.00	91,432.00
අනිකාල දීමනා	37,395.49	90,229.00
නිල ඇඳුම්	48,000.00	69,759.00
වැටුප් හිඟ මුදල්	607,458.87	6,503.00
ක්ෂයවීම	4,289,248.69	4,088,798.00
මුද්‍රණ, සංඛ්‍යාලේඛන සහ කාර්යාල අවශ්‍යතා	4,215,625.44	3,504,762.00
ණය ආපසු ගෙවීම	990,476.59	990,477.00
ආරක්ෂක සේවා සඳහා ගාස්තු	2,646,232.60	2,350,293.00
වරිපනම් බදු	2,391,792.81	2,331,357.00
විදුලිය	2,025,466.14	2,277,431.00
කාර්යාල පරිගණක නඩත්තුව	1,358,940.00	1,501,456.00
සනීපාරක්ෂක සේවා සඳහා ගාස්තු	885,354.31	901,161.00
ඉන්ධන සහ මෝටර් රථ නඩත්තු	698,230.21	819,128.00
තැපැල් ගාස්තු සහ විදුලි පණිවුඩ	594,497.25	548,965.00
කාර්යාල උපකරණ නඩත්තුව	872,552.31	544,428.00
දූරකථන	494,019.55	480,769.00
සෝපාන නඩත්තු කිරීම	481,754.53	386,669.00
ගොඩනැගිලි නඩත්තු කටයුතු	909,007.00	377,356.00
ජලය	228,068.41	182,221.00
නිල බංගලාවේ වියදම්	50,866.00	136,209.00
පරීක්ෂණ ගාස්තු	173,350.00	122,840.00
පුවත්පත් දැන්වීම්	246,085.80	106,575.00
පුවත්පත් සහ වාර සඟරා	65,640.00	65,640.00
මුද්දර ගාස්තු	63,525.00	57,275.00
රාජකීය ඉඩම් බද්ද	5,000.00	5,000.00
ප්‍රවාහන	1,160.00	1,238.00
නීති ගාස්තු	175,480.00	263,017.00
විගණන ගාස්තු	115,000.00	80,000.00
වෘත්තීය ගාස්තු	59,500.00	62,500.00
ගොඩනැගිලි රක්ෂණය	101,230.34	-
වැටුප් හා චේතන	25,766.13	-
කාර්ය මණ්ඩල පුහුණුව	-	6,600.00
කාර්ය මණ්ඩල සුභසාධනය	-	9,452.00
පරිත්‍යාගය	-	2,500.00
	67,004,995.13	61,372,508.00

Dayananda Samarawickrama & Co. No. 19 G, St. Joseph's Road, Nugegoda. * Chartered Accountants *

සටහන 06 - මූල්‍ය වියදම්	2024	2023
	රු. ශත.	රු. ශත.
බැංකු ගාස්තු	40,138.61	22,337.00
ණය අලාභය සඳහා ප්‍රතිපාදන	14,461.95	-
	54,600.56	**22,337.00**

සටහන 07 - ආදායම් බදු වියදම්		
	රු. ශත.	රු. ශත.
ගිණුම්කරණ ලාභය ආදායම් බද්දට අතර සැසඳීම		
බදු පෙර ලාභය	118,350,335.80	83,676,033.00
අඩු - වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායම	(31,266,735.74)	-
	87,083,600.06	83,676,033.00
ගැලපීම්	-	(839,032.00)
බදු සඳහා අවසර නොලබන මුළු වියදම්	6,917,239.06	8,769,910.20
බදු සඳහා සමස්ත අඩු කළ හැකි වියදම්	(2,908,549.44)	(4,015,269.58)
ව්‍යාපාර ආදායමෙන් ගැලපූ ලාභය	91,092,289.68	87,591,641.62
ආයෝජන ආදායම		
පොලී ආදායම	9,038,340.26	-
කුලී ආදායම	22,228,395.48	-
(-) කුලිය ආශ්‍රිත වියදම්	(2,992,178.81)	-
	28,274,556.93	-
මුළු බදු අය කළ හැකි ආදායම	119,366,846.61	87,591,641.62
ආදායම් බදු වියදම 30%	**35,810,053.98**	**26,277,492.49**



සටහන 08 - දේපළ, පිරියක සහ උපකරණ

	බදු ඉඩම (බදු රඳවා ගැනීම්)	ගොඩනැගිලි	මෝටර් රථ	විදුලිවිදුලි උපකරණ සහ සවිකිරීම්	පරිගණක උපකරණ	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	කාර්යාලය උපකරණ	එකතුව
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
2024.01.01 දිනට පිරිවැය	98,000,000.00	10,400,000.00	16,008,750.00	12,235,745.00	6,737,770.00	1,481,009.00	3,215,340.00	148,078,614.00
වසර තුළ එකතු කිරීම්	-	-	-	1,285,641.06	344,870.36	24,399.57	80,527.21	1,735,438.20
වසර තුළ බැහැර කිරීම්	-	-	-	(225,000.00)	-	-	-	(225,000.00)
2024.12.31 දිනට පිරිවැය	**98,000,000.00**	**10,400,000.00**	**16,008,750.00**	**13,296,386.06**	**7,082,640.36**	**1,505,408.57**	**3,295,867.21**	**149,589,052.20**
2024.01.01 දිනට සමුච්චිත ක්ෂය	28,000,000.00	8,914,283.00	16,008,750.00	4,219,715.00	5,117,673.00	1,190,690.00	1,811,794.00	65,262,905.00
වසර සඳහා ගාස්තුව	2,333,333.29	247,618.25	-	934,170.77	498,725.44	50,137.50	225,262.63	4,289,247.88
වසර තුළ බැහැර කිරීම්	-	-	-	(225,000.00)	-	-	-	(225,000.00)
2024.12.31 දිනට සමුච්චිත ක්ෂය	30,333,333.29	9,161,901.25	16,008,750.45	4,928,885.77	5,616,398.44	1,240,827.50	2,037,056.63	69,327,152.88
ධාරණ අගය								
2023.01.01 දිනට ලියාහල අගය	70,000,000.00	1,485,717.00	11,789,035.00	8,016,030.00	1,620,097.00	290,319.00	1,403,546.00	82,815,709.00
2024.12.31 දිනට ලියාහල අගය	**67,666,666.71**	**1,238,098.75**	**(0.45)**	**8,367,500.29**	**1,466,241.92**	**264,581.07**	**1,258,810.58**	**80,261,899.32**

Jayananda Samaravikrama & Co.
No. 19 C,
St. Joseph's Road,
Mugalanda

සටහන 09 - ආයෝජන දේපළ

	31.12.2024	31.12.2023
	රු.ශත .	රු.ශත .
ආයෝජන දේපළ		
ජනවාරි 01 වන දින ආරම්භයේදී පිරිවැය	**41,600,000.00**	41,600,000.00
වසර තුළ එකතු කිරීම්	-	-
වසර තුළ කපා හැරීම	-	-
දෙසැම්බර් 31 වන දින අවසානය වන විට පිරිවැය	**41,600,000.00**	41,600,000.00
ජනවාරි 01 වන දින ආරම්භයේ දී ණය ආපසු ගෙවීම.	**18,323,813.00**	17,333,336.00
වසර සඳහා අය කිරීම	**990,476.59**	990,477.00
වසර තුළ බැහැර කිරීම	-	-
දෙසැම්බර් 31 වන දින අවසන් වන විට ඇස්තමේන්තුගත ණය ආපසු ගෙවීම	**19,314,289.59**	18,323,813.00
දෙසැම්බර් 31 අවසානයේ ලියාහල අගය	**22,285,710.41**	23,276,187.00



මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2024

සටහන 10 - ස්ථාවර තැන්පතු	සටහන්	2024	2023
		රු. ශත.	රු. ශත.
NSB නගර ශාඛාව		60,816,191.76	97,497,665.00
මහජන බැංකුව		72,000,000.00	-
		132,816,191.76	**97,497,665.00**
සටහන 11 - ඉන්වෙන්ටරි (භාණ්ඩ ලේඛණ)			
		රු. ශත.	රු. ශත.
ලිපි ද්‍රව්‍ය තොගය		381,494.60	700,069.84
මුද්‍රිත ලිපි ද්‍රව්‍ය		77,440.00	505,019.92
විදුලි අයිතම		70,445.25	44,893.09
සනීපාරක්ෂක අයිතම		128,001.00	23,717.84
		657,380.85	**1,273,701.12**
සටහන 12 - අනෙකුත් ලැබිය හැකි දේ			
		රු. ශත.	රු. ශත.
ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලිය		1,595,636.71	2,935,524.00
ලැබිය යුතු කුලිය		5,202,851.01	2,900,000.00
ජල බෝතල් සඳහා ලැබිය යුතු තැන්පතු මුදල		2,000.00	2,000.00
NWSDB සඳහා ලැබිය යුතු තැන්පතු මුදල		3,000.00	-
		6,803,487.72	**5,837,524.00**
සටහන 13 - ණය සහ අත්තිකාරම්			
		රු. ශත.	රු. ශත.
රාජ්‍ය ආයතනවල සේවකයින්ට ණය	13.1	699,554,441.56	625,006,547.71
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	13.2	11,260,597.23	13,168,191.00
		710,815,038.79	**638,174,738.71**
සටහන 13.1 - රාජ්‍ය ආයතනවල සේවකයින්ට ණය			
		රු. ශත.	රු. ශත.
රජයේ සංස්ථා සහ සමාගම්			
සක්‍රිය ණය		688,364,379.94	611,610,663.77
අක්‍රිය ණය		12,336,205.17	14,836,341.94
		700,700,585.11	626,447,005.71
අවිනිශ්චිත පොළිය / අක්‍රිය ණය		(477,561.80)	(662,186.00)
ණය අලාභ සඳහා ප්‍රතිපාදන		(668,581.75)	(778,272.00)
		699,554,441.56	**625,006,547.71**
සටහන - 13.2 කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්			
		රු. ශත.	රු. ශත.
කාර්ය මණ්ඩල ණය - නව යෝජනා ක්‍රමය - දස මස් ණය		4,518,823.26	6,228,518.00
කාර්ය මණ්ඩල ණය 11.5% (250,000)		3,510,185.35	4,166,954.00
කාර්ය මණ්ඩල ණය 11.5% (100,000)		1,532,497.37	2,043,892.00
කාර්ය මණ්ඩල ණය-ටැබ් ණය 4.5%		1,686,477.94	688,096.00
පාපැදි ණය		4,613.31	30,231.00
උත්සව අත්තිකාරම්		8,000.00	10,500.00
		11,260,597.23	**13,168,191.00**
සටහන 14 - මුදල් සහ මුදල් සමානකම්			
		රු. ශත.	රු. ශත.
මහජන බැංකුව- ඉතිරිකිරීමේ ගිණුම අංක 204 200 2300 85389		7,596,139.29	18,373,088.00
මහජන බැංකුව - ජංගම ගිණුම අංක 204100 1600 85389		5,909,147.21	5,740,999.00
මහජන බැංකුව - ජංගම - ගිණුම් අංකය 204100 1800 85388		1,132,481.56	1,525,379.00
මහජන බැංකුව - ජංගම - ගිණුම් අංකය 204100 2500 85389		170,285.28	1,436,692.00
අතැති මුදල්		20,000.00	19,383.00
		14,828,053.34	**27,095,541.00**

Dekananda Samarawickrama & Co. No. 19 C, St. Joseph's Road, Nugegoda. * Chartered Accountants *

සටහන 15 - විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම	සටහන්	2024	2023
		රු. ශත.	රු. ශත.
වසර ආරම්භයේදී ශේෂය		24,043,956.20	22,579,760.00
වසර තුළ ප්‍රතිපාදනය		562,880.00	3,551,926.40
වසර තුළ ගෙවීම්		(839,570.00)	(2,087,730.20)
අධි ඌන ප්‍රතිපාදනය		(14,580.00)	-
වසර අවසානයේ ශේෂය		**23,752,687.00**	**24,043,956.20**
සටහන 16 - අනෙකුත් ජංගම වගකීම්		රු. ශත.	රු. ශත.
කුලී තැන්පතු	16.1	11,543,110.50	9,649,434.00
උපචිත වියදම්	16.2	2,121,927.80	1,309,889.00
රජයේ සේවකයින්ට ලබා දුන් අතිරික්ත ණය වාරික		1,323,799.62	908,717.00
ණයහිමියන්	16.3	312,369.96	330,913.00
ආපසු ගෙවිය හැකි තැන්පතුව		-	10,000.00
වෙනත් ආපසු ගෙවිය හැකි තැන්පතු - රිලයබල් ඇන්ඩ් ඇලර්ට සිකියුරිටි (පුද්) සමාගම		-	100,000.00
ආරක්ෂක තැන්පතුව		155,000.00	-
		15,456,207.88	**12,308,953.00**
සටහන 16.1 කුලී තැන්පතු		රු. ශත.	රු. ශත.
ජාතික ඉතිරිකිරීමේ බැංකුව		4,350,000.00	3,540,000.00
ලංකා විදුලිබල මණ්ඩලය		3,210,000.00	2,700,000.00
ලංකා විදුලිබල මණ්ඩලය - තොරතුරු තාක්ෂණ		1,800,000.00	1,800,025.00
සමුපකාර සේවක කොමිෂන් සභාව		1,489,408.50	1,489,409.00
MAA ඇසෝසියේට්ස්		120,000.00	120,000.00
Office Equipment PLC		573,702.00	-
		11,543,110.50	**9,649,434.00**
සටහන 16.2 උපචිත වියදම්		රු. ශත.	රු. ශත.
ගොඩනැගිලි නඩත්තු කටයුතු		347,906.60	347,906.00
විදුලිය		144,875.49	208,345.00
ආරක්ෂක ගාස්තු		232,519.00	197,294.00
විශේෂ දීමනා		167,718.76	174,504.00
වාර්ෂික ප්‍රසාද දීමනාව		70,520.83	89,271.00
විගණන ගාස්තු		115,000.00	80,000.00
පිරිසිදු කිරීමේ වියදම්		85,005.58	71,050.00
දුරකථන		39,279.18	40,434.00
උපයන විට බදු		28,896.10	31,162.00
මුද්දර ගාස්තු		20,300.00	16,350.00
අතිකාල		4,626.49	6,112.00
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය		163,988.52	797.00
තැපැල් ගාස්තු		60,000.00	-
වරිපනම් බදු		641.25	-
ඖෂධ වැටුප්		610,650.00	-
වෘත්තීය ගාස්තු		30,000.00	30,000.00
ජලය		-	16,664.00
		2,121,927.80	**1,309,889.00**
සටහන 16.3 ණයහිමියන්		රු. ශත.	රු. ශත.
අවිනිශ්චිත ණය හිමියන්ගේ ලෙජරය		312,369.96	330,913.00
		312,369.96	**330,913.00**
සටහන 17 - ගෙවිය යුතු ආදායම් බද්ද		රු. ශත.	රු. ශත.
වසර ආරම්භයේදී ශේෂය		13,866,425.12	10,279,401.78
වසර තුළ ප්‍රතිපාදනය		35,810,053.98	26,277,492.49
රඳවාගත් බදු බැර		(2,262,411.34)	(3,256,527.15)
වසර තුළ ගෙවන ලද ආදායම් බදු		(26,622,179.50)	(19,433,942.00)
වසර අවසානයේ ශේෂය		**20,791,888.00**	**13,866,425.12**

Dayananda Samarawickrema & Co.
No. 19 C,
St. Joseph's Road,
Nugegoda.
Chartered Accountants